# මීරිගම ඉඟුරු

රචනය — එස්. එන්. දිසානායක විසිනි

**පෙරවදන :**

පෙර අපේ සාහිත්‍යයේ,
"ඉඟුරු දුරු ඇ යුතු
මල් වතු හා වවා වතු" යයි ගෘහිණියන්ට ඔවා බස් දී ඇත. ඉඟුරු දුරු කහ ආදිය සෑම නිවසකම එදිනෙදා පාවිච්චියට අත්‍යාවශ්‍ය ද්‍රව්‍යයන් වෙති. ඉඟුරු දෝසි ඉතා රසවත් සිංහල කෑමක් වන අතර, ඉඟුරු සවදේශීය වෛද්‍ය ක්‍රමයට අත්‍යාවශ්‍ය ඖෂධයක් වන වාත් හැර මස් හා මාළුපිණි ආදියද රසවත් කිරීමට යොදන ආහාර ද්‍රව්‍යයක් වෙයි. බටහිර වෛද්‍ය ක්‍රමය අනුව වුවද මෙය වාතනාශක ඖෂධයකි. (Carminative) ඉඟුරු යොදා සාදන ජින්ජර් ඒල් හා ජින්ජර් බියර් වැනි රසපානයන්ද ඇත. ලංකාවේ ඉඟුරු විශාල වශයෙන් වගා කරණ පෙදෙස් අතර මීරිගම පෙදෙසටද වැදගත් තැනක් හිමි වෙයි. මීරිගම කෘෂිකර්ම උපදේශක කොටසේ පොල් ඉඩම්තුළ ඉඟුරු අක්කර සියයක් පමණ වගා වී ඇත.

**අවශ්‍ය ශද්ශගුණය හා පස :** ලංකාවේ තෙත් කලාපයේ මුහුදු මට්ටමෙන් අඩි 2,000ක් දක්වා ඉඟුරු සාර්ථක ලෙස වගා කළ හැක. තෙත සෞම්‍ය දේශගුණයක් හා මනා ලෙස ජලය බැස යන සාරවත් පසක්ද ඉඟුරු වගාවට අත්‍යාවශ්‍යයි. තද මැටි පසේ හෝ වැලි පසේ සශ්‍රිකව ඉඟුරු වගා නොවේ. තද ඉඩෝරය ඇති වුවහොත් අස්වැන්න අඩු වෙනවා නොඅනුමානයි. එමෙන්ම වර්ෂාව අධික වීමෙන්ද පසෙන් බෝවන පුස්රෝග පහසුවෙන් බෝවී යයි. එහෙත් වියලි කලාප යේද ජලය සම්පාදනය කිරීමෙන් ඉඟුරු සාර්ථක ලෙස වගා කළ හැක. ඉඟුරු වගා කර ඇති මීරිගම මුද්දරගම ආ. නි. ඕවර්සියර් කොටසේ අක්කර 45ක් පමණ බිම් ප්‍රමාණ යක් ඉඟුරු පොල් වගා අතර වගා වී ඇත.

**වගා කාලය :** මේ පළාත්වල ඉඟුරු වගා වගා කරනු ලබන්නේ සෑම් අවුරුද්දකම මාර්තු-අප්‍රේල් කාල සීමාවකදීය. මේ සඳහා පස සකස් කරනු ලබන්නේ පෙබරවාරි මාස යේදී ය. මේ කාලය ඉඟුරු සිටුවීම සඳහා යොදා ගන්නේ තද වර්ෂාව හෝ තද ඉඩෝරය නොමැති කාල සීමාවක් බැවිනි. එකල සිටුවන ඉඟුරු අල කුණු නොවී මනා ලෙස පැළ වෙයි.

**වර්ග :** මීරිගම පළාතේ ගොවියෝ ඉඟුරු වර්ග දෙකක් වගා කරති. එක් වර්ගයක් දේශීය වර්ගය නමින් හැඳින් වෙන අතර අනික් වර්ගය චීන වර්ගය නමින් හැඳින් වේ. දේශීය වර්ගයේ අස්වැන්න නෙලා ගැනීමට මාස 10-12 දක්වා කාලයක් ගත වන අතර චීන වර්ගයේ අල ගලවා ගැනීම මාස 6-8 දක්වා කාලයකින් සිදු කළ හැක. දේශීය වර්ගය සාමාන්‍යයෙන් ව්‍යාංජන රසවත් කිරීමට හා ඖෂධයක් වශ යෙන් පාවිච්චි කරන අතර චීන වර්ගය වඩාත් සුදුසු වන්නේ දෝසි දැමීම සඳහාය.

**අතරතුර වගාවන් :** සාමාන්‍යයෙන් ඉඟුරු වගා කරනු ලබන්නේ බුලත් කොරටු තුළ බුලත් වැල් වල සෙවන වැටෙන බිම් පෙදෙස් වලය. සෙවන වැටෙන ස්ථානවල වැඩෙන ඉඟුරු පැළ වඩාත් සාරවත්ව වැඩෙන බැව් ගොවියන්ගේ අත් දැකීමකි. සාමාන්‍යයෙන් පොල් ඉඩම් තුළ ඉඟුරු වගා කළ හැක්කේ අවුරුදු දෙකක් පමණ කාල සීමාවක් පමණි. ඉන් පසු එම ඉඩම් පූරංවීමට තිබෙන්නට ඉඩ හැර කලක් ගත වූ පසු නැවතත් ඉඟුරු හෝ අන්නාසි වගා කරනු ලැබේ. ඉඟුරු, කොඩොල් අල වගා අතරද වගා කරනු ලැබේ.

**අක්කර ප්‍රමාණය වැඩි කිරීමට ඇති බාධක :** ඉඟුරු වලට අන්නාසි වගාවට මෙන් රජයෙන් ආධාර හෝ සහතික මිළක් නොලැබෙන බැවින් ඉඟුරු වෙනුවට අන්නාසි වගා කිරීමට ගොවියෝ පෙළෙඹෙති. තවද අන්නාසි වලට මෙන් විශාල අලෙවියක් ඉඟුරු වලට නොමැත. ඉඟුරු පරිභොග කරනු ලබන්නේ ඉතා සුළු ප්‍රමාණයක් බැවින් වෙළඳ පොළේ ඇති මිළ ගණන්ද වෙනස් වන සුළුය. තවද ගොවියන්ටම අයත් පොල් ඉඩම්

නොමැති බැවින් ඉඟුරු වගා කිරීමට සුදුසු මනා ලෙස ජලය බැස යන ඉඩම් සොයා ගැනීම ගොවියන්ට අපහසු කාරියකි. තවද රජය පිට රටින් වේලන ලද ඉඟුරු මෙරටට ගෙන්වන බැවින් ඉඟුරු මිල පහත් මට්ටමක පවතී. තවද ඉඟුරු වගාවට පොහොර සහනාධාර ක්‍රමයක්ද නොමැත.

**සිටුවීම :** සිටුවීම සඳහා අක්කරයකට ඉඟුරු අල රාත්තල් 800ක් පමණ අවශ්‍ය වෙයි. ඉඟුරු අල පේළි අතර අඟල් 12ක් හා පැළ අතර අඟල් 12ක් දුර ප්‍රමාණයක් තබා සාමාන්‍යයෙන් වගා කරනු ලැබේ. එහෙත් පසේ තත්ත්වය හා වගා ක්‍රම අනුව මෙම පරතරයන් වෙනස් කළ හැක. සිටුවීම සඳහා ගන්නා අල ඊට ඉහතින් කන්නයේ අස්වැන්නෙන් උගුල්ලා සිටුවනු ලැබේ. ඒ අනුව බීජ අල නරක්වීමක් හෝ කුණුවීමක් සිදු නොවේ. ඉඟුරු සිටුවා පාත්ති වලට පිදුරු වසුනක් යෙදීමෙන් වල් පැළ මඩිනය වන අතර ඉඩෝර කාලයට පාත්තිවල තෙතමනයද මේ අනුව ආරක්ෂා කෙරේ.

**වගා වියදම් :** අක්කරයක ඉඟුරු වගා කිරීම සඳහා යන වියදම මෙසේය :

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. | බිම නැගීම ... ... ... | 80 | 0 |
| 2. | බීජ ඉඟුරු අල (හො. 8) ... ... | 400 | 0 |
| 3. | පිදුරු ... ... ... ... | 50 | 0 |
| 4. | පොහොර (රසායනික) හො. 5 ... ... | 100 | 0 |
| 5. | සිටුවීම (මිනිසුන් 6 දෙනෙක්) ... ... | 20 | 0 |
| 6. | පිදුරු ප්‍රවාහනය කිරීම හා ඇතිරීම ... ... | 50 | 0 |
| 7. | දෙවරක් වල් නෙලීම (මිනිසුන් දෙදෙනෙක්) ... | 40 | 0 |
| 8. | ඉඟුරු ඉගිලීම ... ... ... | 55 | 0 |
| 9. | අලවල මුල් ගැලවීම ... ... ... | 75 | 0 |
| 10. | වෙළඳපොළට ප්‍රවාහනය කිරීම ... ... | 30 | 0 |
| | අක්කරයක් සඳහා මුළු වියදම ... | 900 | 0 |

**අස්වැන්න නෙලා ගැනීම :**

අල සිටුවා මාස 10-12 දක්වා කාලයකින් ඉඟුරු අල ගලවා ගත හැක. එක්වරක අල ගලවා ගැනීම කරනු ලබන්නේ සුළු බිම් ප්‍රමාණයක පමණි. ඒ අනුව අක්කරයක අල ගලවා ගනු ලබන්නේ වාර කීපයක් ඇතුළතය. එබැවින් අස්වැන්න අලෙවි කිරීමද ඒ අනුව පහසු වෙයි. ඉඟුරු මිල පහත් මට්ටමක ඇති විට අල පොළොවෙන් නොගලවා වැඩිපුර අවුරුද්දක කාලයක් තබා ගැනීමට පුළුවන් බැව් ගොවියන්ගේ අත් දැකීමයි. මීරිගම පළාතේ ගොවියන් සාමාන්‍යයෙන් අක්කරයකින් ඉඟුරු ටොන් 3-3½ක් දක්වා ප්‍රමාණයක් උගුල්ලා ගනිති.

**ආදායම් :** ඉඟුරු හොණ්ඩරයක් රු. 25-55 දක්වා ගණනකට අලෙවි කළ හැක.

| | රු. | ශ. |
|---|---|---|
| හොණ්ඩරයක් රු. 25 බැගින් හො. 70 කට ... ... | 1,750 | 0 |
| අක්කරයක වගා වියදම රු. 900 ... ... | 900 | 0 |
| ඉඟුරු අක්කරයකින් ලැබිය හැකි අවමය ලාභය ... | 850 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| හොණ්ඩරයක් රු. 55 බැගින් හොණ්ඩර 70 ට ... | 3,850 | 0 |
| අක්කරයක වගා වියදම ... ... ... | 900 | 0 |
| ඉඟුරු අක්කරයකින් ලැබිය හැකි උපරිම ලාභය ... | 2,950 | 0 |

**පසුවදන :** ලංකාවේ ඉඟුරු වගාව දියුණු කිරීමට නම් ඉඟුරු වේලීමේ කාර්යක්ෂම නවීන ක්‍රම, අලෙවි කිරීමේ පහසුකම් ඇති වීම සඳහා රටින් මෙරටට ඉඟුරු ගෙන්වීමද ක්‍රම ක්‍රමයෙන් තහනම් කළ යුතු බැව් මේ අනුව කාටත් වැටහෙනවා ඇත.

**නිමි.**